# සාමාන්‍ය සමයේ විසි තුන් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය — එසෙකියෙල් 33: 7–9

*එසෙකියෙල් දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"දුෂ්ඨයාට අවවාද දෙන්නට මැළිවන්නා
ඔහුගේ මරණය ගැන වගකිය යුත්තේය."

"එසේ ම, මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඉශ්රායෙල් සෙනඟට මුර සෙබලෙකු කෙළෙමි. නුඹ ද මාගේ මුවින් වචනය අසා මාගේ නාමයෙන් ඔවුන්ට අවවාද කරන්න. එම්බා දුෂ්ඨය, නුඹ නසිනවා ම ඇතැ යි මා දුෂ්ඨයාට කී කල්හි තමාගේ මාර්ග යෙන් හැරෙන ලෙස දුෂ්ඨයාට අවවාද කිරීමට නුඹ කතා නොකර සිටියොත්, දුෂ්ඨ වූ ඔහු තමාගේ පාපයෙහි ම නසිනු ඇත.

එහෙත් නුඹ ඔහුගේ මරණය ගැන වගකිව යුත්තා වශයෙන් මම සළකමි. එසේ වී නමුත් තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ ගැන දුෂ්ඨයාට අවවාද කළ කල්හි ඔහු තමාගේ මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමාගේ අයුතු කම නිසා නසිනු ඇත. එසේ වුවොත් නුඹේ ප්‍රාණය නුඹ ගළවා ගනු ඇත."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 95: 1–2, 6–9

පිළිතුර : සමිඳාණන් පවසන දෙයට සවන් දෙමු.

ගීය : එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු:
අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු.
තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු:
එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු.
අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු.
එතුමාණෝ අපේ දෙවිඳාණෝය.
අපි එතුමන්ගේ සෙනඟ ය.
එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය.
එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!

"පාළුකරයේ මස්සා නම්
ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද
මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද
ඔබේ සිත් දැඩි කර නොගන්න.
එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය.
මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ ය.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 13: 8-10

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරීමය."

එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක් ගැන කිසිවෙකුට ණය ගැති නොවන්න. අසල්වැසියාට ප්‍රේම කරන්නෝ ව්‍යවස්ථාව ඉටු කරති. මන්ද, "කාමමිථ්‍යාචාරය නොකරන්න, මිනී නොමරන්න, සොරකම් නොකරන්න, ලෝභ නොවන්න." යන ආඥා ද තවත් අමතර ආඥා ඇත්නම් ඒවා ද, "තුඹ තුඹට ප්‍රේම කරන්නාක් මෙන් තුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න" යන පාඨයෙහි සම්පිණ්ඩනය වී ඇත. ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි. එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරීම ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — 2 කොරින්ති 5: 19

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, දෙවියන් වහන්සේ,
ලෝකය තමන් වහන්සේට සමගි කරගනිමින් සිට බවත්,
ඒ සමගි කිරීමේ සේවය අපට භාර දුන් සේක.
ආලේලූයා!

## සුවිශේෂය — මතෙව් 18: 15–20

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

ඔබ කියන දේ ඔහු පිළිගත්තොත්
ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තෙහිය.

“ඔබගේ සහෝදරයා ඔබට විරුද්ධ ව පව් කළොත් පෞද්ගලිකව ඔහු හමු වී ඔහුගේ වරද පෙන්වා දෙන්න. ඔබ කියන දේ ඔහු පිළිගත්තොත් ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තෙහි ය. නොපිළිගත්තොත් සාක්ෂිකාරයන් දෙදෙනෙකුගේ හෝ තුන් දෙනෙකුගේ හෝ සාක්ෂියෙන් හැම පැමිණිල්ලක් ම ස්ථිර වන පිණිස ඔබ සමඟ තවත් එක් කෙනෙකු නොහොත් දෙදෙනෙකු කැඳවාගෙන යන්න. ඔහු ඔවුන් කියන දේත් නොපිළිගත්තොත් සභාවට දන්වන්න. සභාව කියන දේත් නොපිළිගත්තොත් ඔහු විජාතිකයෙකු හා අයකැමියෙකු මෙන් සලකන්න.

සැබැවින් ම මම ඔබට කියමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නාහු ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නහු ද, එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය. නැවතත් මම ඔබට කියමි. පොළොවෙහි ඔබෙන් දෙදෙනෙක් තමන් අයදින කවර දෙයක් ගැන වුව ද එකඟ වන්නෝ නම්, ස්වර්ගයෙහි වන මාගේ පියාණන් වහන්සේගෙන් ඒ දෙය ඔවුන්ට ලැබෙන්නේ ය. මන්ද, යම් තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස් ව සිටින් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

## සාමාන්‍ය සමයේ 23 වෙනි ඉරුදින - 2017-09-10

**හැඳින්වීම** : "දෙවිඳුන්ගේ ප්‍රේමය හඳුනාගැනීම යනු සැබෑ සිත් හැරීමකි"

දේව ජනතාව තුළ කිතු සමාව දීමේ බලය ක්‍රියාකාරී වන්නේ සැබෑ සිත්හැරීම නිසා මතුවන ප්‍රේමය තුළිනි. ප්‍රේම කිරිම නීතීය සම්පූර්ණ කිරීමකි. නීතියේ සඳහන් සියළු දේ කිරීමට වඩා ප්‍රේම කිරීම තුළින් නීතිය සම්පූර්ණත්වයට පත්කළ හැකිය. එමනිසා ප්‍රේමයෙන් පමණක් එකිනෙකාට ණයගැති වන්නට උත්සහ දරමු. එකිනෙකාගේ වැරදි වලට සමාව දෙන්නට පසුබට නොවෙමු. අප සතු සමාව දීමේ බලය ප්‍රේමයෙන් අත් දකිමු. එසේ අත්දකින්නට අවැසි වරම් මෙම යාගය තුළින් ඉල්ලා සිටිමු.

**ඇතුලුවීමේ ගීය** : කි.ගී අංක 4 : ගයව් ගයව් සමිඳුන් හට

**පළමු කියවීම සඳහා හැඳින්වීම** : එසකියෙල් 33 : 7-9

ඊශ්‍රායෙල් ජනතාවට මුර සෙබළෙකු සේ පත්කළ දිවැසිවර එසකියෙල් තුළින් ප්‍රකාශවෙන දෙවියන් වහන්සේගේ පණිවිඩය මෙසේය.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගීය ගායනා කරන්න.

**දෙවන කියවීම සඳහා හැඳින්වීම**: රෝම 13 : 8-10
ප්‍රේම කිරීම තුළින් නීතිය සම්පූර්ණයෙන් ඉටුකළ හැකි බව ශු. පාවුලු තුමා අපට මෙසේ පැහැදිලි කරයි.

**සාධුකාරය** : ආලේලූයියා ///
සමිඳුනී සත්‍යය නම් ඔබගේ ධර්මයයි. සත්‍යයෙහි අප කැප කළ මැනව. ආලේලූයියා //

**ශු. සුවිශේෂය** : මතෙව් 18 : 15-20

**විශ්වාසකයින්ගේ යැදුම්**

**පිළිතුර** : ස්වාමිනී අප කරන යාච්ඤා ඇසුව මැනව.

1. ආදර දෙව්පියාණනී, ක්‍රිස්තු ප්‍රේමය තුළ පවතින සැබෑ සිත් හැරීම හා සමාව දීමේ මහගු ගුණාංග වලින් පිරි සභාවක් ගොඩ නගන්නට ගිහි පැවිදි පූජක සැමහට මඟ පෙන්වීම ලබාදෙන පිණිස,

2. ආදර දෙව්පියාණනී, මානව දයාවෙන් හා සාමයෙන් ජනතා හදවත් පුබුදුවාලන්නට මානව දයාව අගයන ජාතී, කුල, ආගම් දේශපාලන භේදයෙන් තොර වූ ජනතා නායකත්වයක් අප අතර ඇතිකරනු පිණිස,

3. ආදර දෙව්පියාණනී, අද දේව වචනය තුළ අප මෙනෙහි කළාවූ ජීවිත දැක්ම අප තුළ ඇති කරනු සඳහා දේව වචනය තේරුම් ගැනීමට ප්‍රඥාව ලබාදෙන පිණිසද,

4. ආදර දෙව්පියාණනී, ක්‍රිස්තු ප්‍රේමය අත්දකින්නට පළමුව අප පවුල් තුළ දෙමාපිය දූ දරුවන් අතර ඇති අසමගිතා තේරුම් නොගැනීමේ දුබලකම් හඳුනාගෙන ගමට, මීසමට ආලෝකයක් වන්නට අප තුළ සැබෑ සිත් හැරීමක් ඇති කරනු පිණිසද,

**පඬුරු පිදීමේ ගීය** : කි.ගී. අංක 199- මොනවට ඔබ මට

**අනුහවයේ ගීය** : කි.ගී. අංක 162- දයා ප්‍රේමය

**අවසාන ගීය** : කි.ගී. අංක 263- කිතු සමිඳුන් ජය දද